පළතුරු වවමු



# වවමු මිදි බඳුනේ
# පුංචි ඉඩ ඇතිනේ
# නෙලමු එල තුටිනේ
# සතුට දෙයි නිතිනේ........



**මිදි** VITIS VINIFERA ලොකු කුඩා සියළු දෙනාම ප්‍රියකරන සී විටමින්, ටැනින්, මැලික් පොටෑසියම්, සෝඩියම් ක්ලෝරයිඩ්, පොටෑසියම් සල්පේට්, යකඩ වැනි පෝෂ්‍යය පදාර්ථ රාශියකින් සමන්විත පළතුරකි. ආනයනික පළතුරක් ලෙස අප රටට පැමිණි මිදි රස බලපු අයට වඩා රස ගැන අසා රස විඳපු අය බොහෝය. එයට හේතුව අතීතයේ මිදිවල අධික මිලය.
වයඹ දිග ඉන්දියානු ප්‍රදේශ පංජාබ්, කාශ්මීර හා ඇප්ගනිස්ථානය හරහා ශ්‍රී ලංකාවට පැමිණි මිදි යාපනය, මහඉලුප්පල්ලම, උතුරු මැද පලාත සහ නිරතුරුව අධික වර්ෂාපතනයක් නොමැති ඕනෑම පලාතක වගාකිරීමට හැකි බව තහවුරු වීමත් සමග මිදි වගාව කෙරෙහි විශාල පිරිසකගේ අවධානය යොමු වී ඇත.

## මිදි ප්‍රභේද

ලංකාවේ පහසුවෙන් වගාකර ගත හැකි මිදි ප්‍රභේද වශයෙන් ඊස්රායල්බ්ලු, කාඩිනල්, එම්.අයි.මස්කට් (තද රෝස පාට මහඉලුප්පල්ලම කෘෂි පරීක්ෂණාගාරය මගින් වැඩි දියුණු කළ ප්‍රභේදය) සහ එම්.අයි ෆ්‍රෙන්ස් (ලා කොල පාට) යන වර්ග බීජ රහිත මිහිරි රසයෙන් යුක්තය. ඉසබෙලා යන මිදි ප්‍රභේදය බීජ සහිත ඇඹුල් රසයෙන් වැඩිය. එම මිදිවලට එතරම් ඉල්ලුමක් නොමැති වූවත් එම්.අයි. මස්කට් සහ ඉසබෙලා යන වර්ග දෙකම මිදි වයින් පෙරීම සදහා බහුල වශයෙන් යොදාගනී. මේ සියලු මිදිවර්ග බඳුනක හෝ වගාකර ගැනීමට හැකිවීම ග්‍රාමීය ප්‍රදේශවල අයට මෙන්ම නාගරික ප්‍රදේශවල ජීවත්වන අයටත්, මහල් නිවාස වල ජීවත්වන අයටත් අනගි අවස්ථාවකි.

## බඳුනක මිදි පැලයක් සිටුවා ගැනීම

මිදි වැලක් බඳුනක වගා කර ගැනීමට හැකියාව ඇති බව කියූ සැනින් ඔබ මවිතයට පත්වීමට පුළුවන. එයට හේතුව මිදි වැලක් වශයෙන් හැඳෙන නිසාය. ගසක් හෝ වැලක් වර්ධනය වී ඵලදාව හටගැනීමට අවශ්‍ය සාධක අපට සපුරාදීමට හැකිනම් අපට අවශ්‍ය ප්‍රතිඵලය ලබා ගත හැක. එසේ නම් මිදි වගාවට අවශ්‍ය පස සහ හිරුඑළිය, පොහොර වැනි ප්‍රධාන කරුණු සපයා දීමයි. ප්‍රථමයෙන් අවශ්‍ය කරන බඳුන විශ්කම්භය අගල් 24 ක් පමණ ඇති විශාල බඳුනක් , පස් මාධ්‍ය වශයෙන් රතු පස් කොටස් 02 යි. වැලි කොටස් 01 යි. වියළි ගොම කොටස් 01 යි. දිරාගිය කොළ පොහොර කොටස් 01 යි. කාබනික පොහොර 1/2, ඩොලමයිට් ග්‍රෑම් 500 පමණ. එකතු කර හොඳින් කලවම් කර සපයා ගත් බඳුනෙහි ඇති සිදුරට උළු කැබැල්ලක් තබා (හොඳින් ජලය වහනය වීම සදහා) සකසා ගත් පස් මාධ්‍ය අගල් 02 ක් පමණ ඉඩක් ඉතිරි වන සේ පුරවා මිදිවැල ඉහළට ගමන් කිරීම සදහා ආධාරකයක් අඩි 07 ක් පමණ උසට. (නොදිරන අගල් 1 ක ජලනලයක් වඩා උචිතය) එහි මැදින් සිටුවා හොඳින් තදකර මිදිපැලය ආධාරකය අසලින් සිටුවා ජලය එකතු කර හොඳින් හිරුඑළිය ලැබෙන ස්ථානයකට තබන්න. මිදිවැල ආධාරකය දිගේ යාමට පටන් ගත් විට සයිකල් රිම් එකක් සේ බට වලින් රවුමක් සාදා ආධාරකයකට සවිකර තබන්න.